# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන)

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2024 ජූලි මස 23 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජූලි මස 04 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[276 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) ඒ වගන්තියේ අදාළ වීම, යම් සන්නිවේදනයක් මාර්ගයෙන් ලිංගික අතවර කිරීම දක්වා ව්‍යාප්ත කිරීම;

(ආ) වචනයෙන් හෝ ක්‍රියාවෙන් ලිංගික අතවර කිරීම සිදුවිය හැකි ක්‍රියාකාරකම් මාලාවක් නිශ්චිතව දැක්වීම; සහ

(ඇ) "සන්නිවේදනය" යන යෙදුම අර්ථ නිරූපණය කිරීම.

එල්.ඩී.-ඕ 55/2024

**(19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක    දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයේ 345 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**2.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 345 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"ලිංගික අතවර කිරීම

345. (1) අඩන්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ යම් සන්නිවේදනයක් මාර්ගයෙන් වෙනත් තැනැත්තකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරනු ලබන කවර හෝ තැනැත්තකු, ලිංගික අතවර කිරීමේ වරද සිදු කරනු ලබන අතර, වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු පහක් දක්වා දීර්ඝ කරනු ලැබිය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ එම තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

(2) ලිංගික අතවර කිරීම බවට පත් වන (1) වන උපවගන්තියේ සඳහන් "වචනයෙන් හෝ ක්‍රියාවෙන්" යන්නට -

(අ) යම් ශබ්දයක් හෝ අංගහාරයක් සිදු කිරීම;

(ආ) යම් වස්තුවක් ප්‍රදර්ශනය කිරීම;

(ඇ) ඇඳුම් ගලවා ඉවත් කිරීම හෝ ඒ තැනැත්තාට නිරුවත් වීමට බල කිරීම;

(ඈ) අනනුඥාත ලිංගික ප්‍රයත්න සහ පැහැදිලි ලිංගික යෝජනා සමග ශාරීරිකව ස්පර්ශ කිරීම;

(ඉ) ලිංගික අනුග්‍රහය සඳහා දැඩිව ඉල්ලා සිටීම හෝ ඒ සඳහා ඉල්ලීමක් කිරීම;

(ඊ) ඒ තැනැත්තාගේ කැමැත්තට පටහැනිව කාමෝද්දීපන දර්ශන පෙන්වීම;

(උ) ලිංගිකත්වයෙන් ආරෝපිත අදහස් දැක්වීම; හෝ

(ඌ) තැති ගැන්වීමේ හෝ පීඩාවට පත් කිරීමේ චේතනාවෙන් යුතුව ලිංගේන්ද්‍රිය නිරාවරණය කිරීම,

ඇතුළත් වේ.

(3) ලිංගික අතවර කිරීම බවට පත් වන (1) වන උපවගන්තියේ සඳහන් "සන්නිවේදනය" යන්නට, විද්‍යුත් මාධ්‍යයක් හෝ අන්තර්ජාලය මාර්ගයෙන් යම් ලිංගික කාර්යය ප්‍රකාශ වන පණිවුඩයක්, අදහස් දැක්වීමක්, පිංතූරයක්, හඬ පටයක් හෝ වීඩියෝ පටයක් සම්ප්‍රේෂණය කිරීම, බෙදා හැරීම, හුවමාරු කිරීම, ජනනය කිරීම, ප්‍රචාරය කිරීම හෝ පළ කිරීම ඇතුළත් වේ.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා අඩන්තේට්ටම් කිරීමට 363 වන වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය

බවට පත් නොවන යම් ක්‍රියාවක් හෝ 365ආ වගන්තිය යටතේ බරපතළ ලිංගික අපයෝජනයක් නොවන යම් ක්‍රියාවක් ඇතුළත් විය හැකි ය.

*පැහැදිලි කිරීම-* *"හානි" යන්නට, මනෝවිද්‍යාත්මක හෝ මානසික කම්පනය ද ඇතුළත් වේ. ”.*

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.